රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල Richmond College, Galle

පැවරුම් අංක 2 13 ශ්‍රේණිය (ප්‍රමණයි)

(නිපුණතාව 08 )

ආර්ථික විද්‍යාව කාලය පැය 3 යි

ප්‍රශ්න 5 ටම පිළිතුරු සපයන්න

(1) 1 වෙළෙඳ පොල ආර්ථිකයක රජයේ ප්‍රදාන ආර්ථික කාර්යයන් සඳහන් කරන්න (ලකුනු 5 යි)

11 ශුද්ධ පොදු භාන්ඩයක් යනු කුමක්ද? ගොලීය පොදු භාංනඩ එයින් වෙනස් වන්නේ කෙසේද පැහැදිලි කරන්න (ලකුනු 5 යි)

111 රාජ්‍ය අසාර්ථක වීම (state. Failure) යන්නෙන් කුමක් අදහස්වේද? (ලකුනු 5 යි)

1v ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුනු5 යි)

(2) 1 යහපත් බදු ක්‍රමයක තිබිය යුතු වැදගත් අංග ලක්ෂණ කවරේද ?

11 ශ්‍රී ලංකාවේ බදු අයභාරය පහල මට්ටමක පැවතිමට හේතු කවරේද

111 ෆිස්කල් ප්‍රතිපත්තිය යනුවෙන කුමක් අදහස් වේද ?

1v රජයේ අයවැයෙහි සංක්‍රාම ගෙවීම් හා භාන්ඩ සහ සේවා මත වියදම් අතර වෙනස පැහැදිලි කරන්න

V රාජ්‍ය අයවැයෙහි වර්තන ගිනුමේ හිගය යනුවෙන් කුමක අදහස් වන්නේද

(කොටසකට ලකුණු 4 බැගිනි)

(3) 1 ආර්ථික කාර්යක්ෂමතා දෘෂ්ටිකොණයෙන් බලන විට වෙළදපොළ විසින් ඕනෑවට වඩා වැඩියෙන් නිපදවන අවසථාවක් ප්‍රස්ථාරයක් ඇසුරෙන් පැහැදිලි කොට විස්තර කරන්න.

11 රාජ්‍ය අයවැයේ ප්‍රාථමික හිගය යන්නෙන් කුමක් අදහස් වේද

III අධ්‍යාපනය පොදු භාණ්ඩයක් ලෙස නොසැලකිමට හේතු දෙකක් සඳහන් කරන්න

IV ශුභ සාධන භාණ්ඩ (merit goods) සහ අවගුණ භාණ්ඩ (demerit goods) අතර වෙනස පෙන්නුම් කොට එක එක් භාණ්ඩ වර්ගය සඳහා උදාහරණය බැගින් දක්වන්න

V බදුකරණයේදී සාධාරණත්වය සැලකිල්ලට ගත හැක ආකාරය පැහැදිලි කරන්න ( කොටසකටලකුණු4 බැගිනි)

(4) 1 ඍජු බදු හා වක්‍ර බදු අතර වෙනස උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න

11 පොදු ආර්ථික ප්‍රතිපත්තියක් වශයෙන් පෞද්ගලිකරණයට පක්ෂව හා විපක්ෂව දැක්විය හැකි කරුණු කවරේද

111 ශ්‍රී ලංකාවේ බදු නොවන අයභාර මුලාශ්‍රයන් කවරේද

IV අයවැය ලේඛනයේ හිගයක් පියවීම සඳහා යොදාගත හැකි ප්‍රසාරණාත්මක ක්‍රම දෙකක් පැහැදිලි කරන්න

V අයවැය ලේඛනයේ වර්තන ගිනුමේ හිගයක් පැවතිමේ ප්‍රතිවපාක කවරේද (කොටසකට ලකුණු 4 බැගිනි)

(5) ) 1 රාජ්‍ය ව්‍යවසායයන් යන්නෙන් කවරක් අදහස් වේද ?

11 ශ්‍රී ලංකාවේ පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් තුනක් නම් කරන්න.

111 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන්හි දක්නට ලැබෙන දුර්වල කාර්යසාධනය කෙරෙහි බලපා ඇති හේතු සඳහන් කරන්න.

1v විදේශීය ණය හිමිකමේ මුලාශ්‍ර අනුව වර්ග කරන්න

V අයවැය ලේඛනය හා සම්බන්ධ අතුරු සම්මත ගිනුම හා විසර්ජන පණත යන සංකල්ප පැහැදිලි කරන්න

(කොටසකට ලකුණු 4 බැගිනි)

සුජිත් චන්ද්‍රවීර මයා
රිච්මන්ඩ් විද්‍යාලය